# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2012 අංක 3 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2012 පෙබරවාරි මස 15 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 පෙබරවාරි මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# 2012 අංක 3 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 පෙබරවාරි මස 15 වන දින]

එල්.ඩී.—ඕ. 44/2011.

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2012 අංක 3 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස්දෙනකුගෙන් මණ්ඩලය සංයුක්ත විය යුතු අතර, ඔවුන්ගෙන් එක් අයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "අවුරුදු පහක කාලයක් සඳහා" යන වචන වෙනුවට "අවුරුදු තුනක කාලයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (7) වන උපවගන්තියේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ වෙනත් යම් සාමාජිකයකු" යන වචන වෙනුවට "සභාපතිවරයා" යන වචනය ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(8) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු මෙන් ම තීරක ඡන්දය දීමේ අයිතිය ඇත. සභාපතිවරයා මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක දී පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු විසින් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

11. (1) ජනාධිපතිවරයා විසින් මණ්ඩලය විමසා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා වන්නේ ය.

(3) ජනාධිපතිවරයා විසින් මණ්ඩලය විමසා අධ්‍යක්ෂ ජනරාල්වරයාව ස්වකීය ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ කර්තව්‍ය සඳහා උපදේශක ස්වභාවයෙන් අධ්‍යක්ෂවරයා රැස්වීම් කටයුතු සඳහා සහභාගි විය යුතු නමුත් ඔහුට එම රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතියක් නොතිබිය යුතු ය.

(5) මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු සහ වෙනත් ප්‍රතිලාභ තීරණය කරනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලය විසින් පවරනු ලබන සාමාන්‍ය විධාන සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයේ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කර ඇති, පනවා ඇති හෝ පවරා ඇති යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය යම් සේවානියුක්තයකු වෙත පවරා දෙනු ලැබිය හැකි අතර එම සේවා නියුක්තයා විසින් තම බලතල, කර්තව්‍ය හෝ කාර්ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය සහ විශේෂ විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම සහ කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වගන්තිය සංශෝධනය කිරීම.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.